The Journal of Studies in Humanities

Volume 5 (I) 2019

Department of Humanities, Rajarata University of Sri Lanka

# උඩරට රාජධානි සමයේ ගම් සහ කුඹුරු ඉඩම් භුක්තියේ නෛතික විධිවිධාන පිළිබඳ සන්නස් හා තුඩපත් ඇසුරෙන් කෙරෙන විමසුමක්

**එම්. ඒ ප්‍රසාද් කුමාර**

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය,

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

Email : prasadmallawaarachchi85@gmail.com

**Abstract**

From the beginning of the Anuradhapura kingdom up to the invasion British invaders in 1815. It is obvious that there was a regional land system unique to Sri Lankan nation was in practice. During the period of the Udarata kingdom, that system had undergone some alterations over the time, and distinct land systems had emerged. The legal structure of village and paddy land systems in the local land system that was put in practice in the nation during the Udarata kingdoms has been studied in this study with reference to Sannas and Tudapat. Identification of the distinctive features of the villages and paddy fields employed by private and governmental institutions during the Udarata kingdoms, local legal arrangements for the use of such lands and the effects of those methods on various economic and social sectors are examined. The aim of this research is to investigate and analyze what kind of distinguishing features can be found in the legal agreements of the Udarata kingdoms to govern the use of villages and paddy lands. As a result, with reference to Sannas and Tudapat, the researcher has conducted an analytical study on the legal structure of village and paddy lands system during the Udarata kingdoms.

**Key Words:** Land System, Paddy, Sannas, Thudapath, Leagal Arragements

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි අනුරාධපුර රාජධානිය ආරම්භයේ සිට ක්‍රි.ව. 1815 දී උඩරට බ්‍රිතාන්‍යයන්ට යටත් වීම දක්වා වූ කාලය තුළ මෙරටට ආවේනික දේශීය ඉඩම් භුක්ති ක්‍රමයක් ක්‍රියාත්මක වනු දැකිය හැකි ය. එම ක්‍රමය කාලීනව යම් යම් වෙනස්වීම්වලට ලක් වූ අතර උඩරට රාජධානි අවධිය වන විට පැහැදිලිව හඳුනාගත හැකි ඉඩම් භුක්ති ක්‍රම වර්ධනය වී තිබිණි. මෙම අධ්‍යයනයේ දී උඩරට රාජධානි සමයේ මෙරට ක්‍රියාත්මක වූ

දේශීය ඉඩම් භුක්ති ක්‍රමය තුළ ගම් හා කුඹුරු ඉඩම් භුක්තියෙහි නෛතික රාමුව සකස් වී තිබූ අයුරු පිළිබඳ සන්නස් හා තුඩපත් ඇසුරෙන් අධ්‍යයනය කර බැලීමක් සිදු කර ඇත. උඩරට රාජධානි සමයේ පෞද්ගලික හා පොදු ආයතන පරිහරණයෙහි තිබූ ගම් හා කුඹුරු ඉඩම් පිළිබඳ ඓතිහාසික තොරතුරු විශ්ලේෂණය හා ඒවායේ අනන්‍යතා ලක්ෂණ හඳුනා ගැනීම, එකී ඉඩම් භුක්ති විඳීමේ දී දේශීය වශයෙන් පැවති නෛතික විධිවිධාන හඳුනා ගැනීම, එම ඉඩම් භුක්ති ක්‍රම ආර්ථික-සාමාජීය ආදී විවිධ අංශවලට සිදු කළ බලපෑම විශ්ලේෂණය ආදිය මෙම පර්යේෂණයේ අරමුණ වේ. උඩරට රාජධානි සමයේ ගම් හා කුඹුරු ඉඩම් භුක්තිය පිළිබඳ වූ නෛතික විධිවිධානයන්හි අනන්‍යතා ලක්ෂණ කවරේ ද? යන පර්යේෂණ ගැටලුව ඔස්සේ යමින් මෙම පර්යේෂණය මෙහයවා තිබේ. ඒ අනුව උඩරට රාජධානි සමයේ ගම් හා කුඹුරු ඉඩම් භුක්තියේ නෛතික රාමුව පිළිබඳ සන්නස් හා තුඩපත් ඇසුරෙන් සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණය මගින් සිදුකර ඇත.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය භාවිත කර ඇත. මේ යටතේ දත්ත ලබා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය, ක්ෂේත්‍ර ගවේෂණය, රාජ්‍ය ලේඛනාගාරයේ තැන්පතු ලේඛන පරීක්ෂාව (කොළඹ සහ මහනුවර ප්‍රධානව) කෙරෙහි විශේෂයෙන් යොමු විය. එසේ ලබාගත් දත්ත සන්සන්දනාත්මකව හා විශ්ලේෂණාත්මකව විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡා කර නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### ගම් ඉඩම් භුක්තිය හා බැඳි නෛතික විධිවිධාන

කන්ද උඩරට රාජධානි සමයේ දේශීය ඉඩම් භුක්තිය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ගම් ඉඩම් රැසක් පෞද්ගලික භුක්ති යසඳහා පමණක් නොව ආගමික ආයතන වෙත ද ප්‍රදානය වී ඇති බවක් පෙනෙන්නට තිබේ. 'ගම' යන සිංහල වචනය ඉඩං පංගු රාශියක් නිරූපණය කිරීමට යෙදේ. ගමේ කොටසක් ලෙස ගැනෙන එක් ඉඩමක් 'පංගුව' හෙවත් 'වසම' ලෙස ගැනෙන අතර 'එක් ස්ථානයක පිහිටි ඉඩං පංගු රාශියක සංහිතාවක් ලෙස 'ගම' යන්න නිර්වචනය කළ හැකි ය (කොඩ්රිංටන් 1980ඃ 1 ). විශේෂයෙන් උඩරට රාජධානි සමයේ දී 'ගම' යන වචනය ජනාවාස වූ ගමක් නිරූපණය කිරීමට ද 'පංගුව' හෙවත් 'වසම' යන වචන ගමක ඇති පෞද්ගලික ඉඩම් කැබැල්ලක් නිරූපණය කිරීමට ද යොදනු ලැබේ. වන්නිපොල සන්නසට අනුව සේනා සම්මත වික්‍රමබාහු විසින් ආචාරිල ආදිත්‍යයා හා ඔහුගේ පුත් සිවත්තාදිත්‍යයා පෙතිකඩ දෙකක් වියා කළ දස්කමට ප්‍රත්‍යුපකාරයක් වශයෙන් වන්නිපොල ගම්භාගය ප්‍රදානය කර තිබේ ( ඤාරසබටඑදබ 1938ඵ 67-68). රඹුක්පොත සන්නසට අනුව රඹුක්පොත සෙනෙවිරත්න මුදලියාගේ දෝනියන්ද වන වාසනාහාමි එතනාට රඹුක්පොත ගමින් පිදෙන ඉඩකඩම් පිළිබඳ ව සඳහන් කර තිබේ ( රඹුක්පොත සන්නස, ධම්මානන්ද 1966ඃ 216-217). 'මීට අඩුත්තු වූ පසු පළමු සිට පැවත ආ අගුළුපත් වල්විල් ඇතුළුව මෙම ගම්පංගු' මෙහි සඳහන් ආකාරයට මෙම ප්‍රදානයට සම්පූර්ණ ගමම අයත් වී නැත. 'ගම්පංගු' හෙවත් ගමට අයත් පෞද්ගලික ඉඩම් කැබලි කිහිපයක් පරිත්‍යාග

වී තිබෙන අතර එකී කැබලිවලට අයත් අගුළුපත් වල්විල් සියල්ලම සමඟ ප්‍රදානය වී තිබේ. මහනුවර යුගයේ බොහෝ ගම් ප්‍රදාන පිළිබඳව දක්වීමේ දී 'ගසකොළ ගෙවතු, වල්විල් එකී ප්‍රදානයට අයත්කොට තිබීම බොහෝවිට දැකිය හැකි අතර මෙය ඉඩම් ප්‍රදාන සන්නස් මගින් දක්වීමේ සාමාන්‍ය සම්ප්‍රදායික වගන්තියක් ලෙස ඇතුළත් වුවා ද විය හැකි ය.

මාරුකොණ සන්නසෙහි ( මාරුකොණ සන්නස, අභයවර්ධන 1978ඃ 31). රාජසිංහ රජු විසින් සිදු කරනු ලබන ගම් ප්‍රදානයක් පිළිබඳ සඳහන් කර තිබේ. මාරුකොණ රත්නාබරණ වැඩකාරයා රජවාසලේ බොහෝ ආභරණ තනවා දුන් නිසා ඊට ප්‍රත්‍යුපකාරයක් වශයෙන් මෙම ගම් ප්‍රදානය සිදු වී තිබේ. 'මාතලේ දිසාවේ අස්ගිරි කෝරලේ පල්ලේසිය පත්තුව මොට්ටුවෙල නිලපාලු ගම්බඩවැඩිල්ල" 16 හා 17 වන සියවස්වල ගොඩ හා මඩ ඉඩම්වල නාම දිවෙල්, ඕවිටි, මලපාලු, නිලපාලු, නින්ද, මුත්තෙට්ටු යනුවෙන් දක්වෙන අතර මෙහි එන 'නිලපාලු ගම්බඩවැඩිල්ල' ද එවන් යෙදුමකි. සමකාලීන යුගයේ දී කිසියම් පුද්ගලයෙකු විසින් තාවකාලිකව භුක්ති විඳින ලද රාජකාරී ඉඩම් බඩවැඩුම / බඩවැඩිලි යනුවෙන් හඳුන්වා තිබේ. එසේ භුක්ති විඳින ලද ගම් ඉඩම් 'ගම්බඩවැල්ල' ලෙස මෙහි අන්තර්ගත වන්නට ඇත. මේ කියන ලද 'මොට්ටුවෙල ගම්බඩවැඩිල්ල' පරිත්‍යාග වන්නේ සුදසින්නකර ප්‍රවේනි සැලැස්මට ය. ඒ අනුව ගම් ප්‍රදානය පරම්පරාගත භුක්ති ක්‍රමයකට ප්‍රදානය වී ඇති බව පැහැදිලි ය. කුට්ටාපිටිය තඹ සන්නසෙහි ද (තිස්සකුමාර, 1992, 136).1 කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස සීතාවක රාජසිංහ රජුගේ කෲරතර පාලනය හමුවේ ආකර්මන්‍ය වූ ශ්‍රී පාද කටයුතු යළි යාවත්කාලීන කිරීම සඳහා ග්‍රාමක්ෂේත්‍ර පිදීමක් පිළිබඳ ව සඳහන් කර තිබේ. තඹ සන්නසෙහි සඳහන් ආකාරයට මෙම ගම් ඉඩම පරිත්‍යාග වන්නේ කුමන කාර්යයකට ද යන්න ස්ථාවරව සඳහන් කිරීමක් සිදු කර තිබේ. එනම් ශ්‍රී පාදය වෙත පුද සත්කාර පැවැත්වීමට හා භික්ෂූන්ගේ වටනාපසයට ය. එකී කාර්යයෙන් පරිබාහිර කාර්යයක් සිදු කිරීම වරදෙක් බව ව්‍යංගයෙන් ප්‍රකාශ වී තිබේ. ඒ අනුව එම ඉඩම් භුක්ති විඳීමේ දී යම් නෛතික රාමුවකට යටත්ව හා අනුගතව සිදු වී ඇති බවක් හඳුනාගත හැකි ය.

වාරිගම අතපත්තු රාළගේ තුඩපතෙහි ( වාරිගම අතපත්තු රාළගේ තුඩපතෙහි පිටපත, ඤාණවිමල, 1967ඃ 136-137) 2 ඉංග්‍රිසීන් සමඟ යුධකොට කටුවන කොටුව සහ තංගල්ලේ කොටුව අල්ලා ගැනීම නිසා ඊට ප්‍රත්‍යුපකාරයක් වශයෙන් සපරගමු දිසාවේ වාරිගම අතපත්තු රාළට සිදු කරන ලබන ගම් ඉඩම් ප්‍රදාන පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කර තිබේ. මේ අනුව ප්‍රදානයට අදාළ ගම් ඉඩම් තුන පරිත්‍යාග වන්නේ කෝරළ දෙකකිනි. ගොඩිගොමුව, මීහිටිය 'කුරුවිට කෝරළය'ටත්, නුගවෙල නින්දගම 'අටකලං කෝරළය'ටත් අයත් වේ. රාජ්‍ය භාණ්ඩාගාරය සතු ගම් ඉඩම් පරිත්‍යාග කිරීමේ දී ඕනෑම කෝරළයකට අයත් ඉඩමක් තම ප්‍රදානය යටතට ගැනීමට තිබූ බල ඒකාධිකාරිය මින් අවබෝධ කරගත හැකි ය. මෙම ගම් තුන ප්‍රදානය වන්නේ බඩවැඩිලි පිණිස ය. එනම් තාවකාලිකව භුක්ති විඳිමින් රාජකාරිය

1 කුට්ටාපිටිය තඹ සන්නස, 'නිරවුල්ව මේ ස්ථානයෙහි ශාසනාන්තර්ධානය දක්වා සස්පිරව පූජා සත්කාර පවත්වා වදාරණ පිණිසත් එහි වත් පිරිමසන තැන්වලට වටනපසට පවත්නා ශටියටත් සපරමු දිශාවේ නවදුන් කෝරලේ බද කුට්ටාපිටිය කියන ගම .... එහි බද ගෙවතු ගහකොළ ගොඩමඩ ඇතුළු වූ මෙම ගම...'

2 වාරිගම අතපත්තු රාළගේ තුඩපතෙහි පිටපත,'කුරුවිට කෝරළය බද ගොඩිගොමුව මී හිටිය යන මේ ගන් දෙක සහ අටකලං කෝරළය බද පන්නිල් පත්තුවෙන් නුගවෙල නින්ද ගම ද මෙම ගන් තුන බඩවැඩිලි පිණිස දරු මුනුපුරු වර්ග පරම්පරාවට ...'

ඉටුකිරීම සඳහා ය. තාවකාලිකව භුක්ති විඳින ලද රාජකාරි ඉඩම් ලෙස මේවා ප්‍රදානය වුවත් එම ඉඩම් 'දරුමුනුපුරු වර්ග පරම්පරාව පවතිනතුරු ප්‍රවේනි සැලැස්මට' යනුවෙන් දක්වා තිබීම නිසා ප්‍රදානය අනාගත ආරක්ෂාව තර කරමින් සිදු වී ඇති බව පැහැදිලි ය. කෙසේ වෙතත් මෙම ඉඩම් භුක්තියට පැවරීමක් මිස අයිතිකාරත්වය තහවුරු කරමින් ලබා නොදුන් බව තුඩපත දෙස පරීක්ෂාකාරී වීමෙන් අවබෝධ කරගත හැකි වේ. පල්ලෙබැද්ද සංඛපාල විහාර තුඩපතෙහි ද (පල්ලෙබැද්ද සංඛපාල විහාර තුඩපතෙහි පිටපත, ඤාණවිමල 1946: 106 )3 රාජාධිරාජසිංහ රජු විසින් කරතොට ධම්මාරාම හිමියන්ට නින්ද බත්ගම් කොට සිදු කරන ප්‍රදානයක් පිළිබඳ ව දක්වා තිබේ. කවි තුනකින් කවි දොළහක් කියවිය හැකි සේ රචනා වූ දුෂ්කර ප්‍රබන්ධයට සන්තෝෂමක් ලෙස භික්ෂුවක් සඳහා පිදෙන මෙම ගම් ඉඩම් ප්‍රදානය සුවිශේෂී එකකි.

මෙහි සඳහන් ආකාරයට පල්ලෙබැද්ද ගම පරිත්‍යාග කරන්නේ සෙසු පරිත්‍යාගයන්ගේ ස්වභාවය අනුව නොවේ. ගම් ප්‍රදානය සමඟ ගමේ සතර සීමාවට ඇතුළත් වූ ගොඩමඩ සියලු බිම් කොටස් සහ මිනිසුන් සතුන් ආදී සියල්ලම ප්‍රදානයට අයත් වී තිබේ. මේ අනුව ගමක් ප්‍රදානය කිරීමේ දී එක 'ගම' එහැමපිටින්ම ප්‍රදානය වී ඇති බව පැහැදිලි වේ. ගමට අයත් බිම් කොටස්, ගමේ වාසය කරන මිනිසුන්, හරකුන් ඇතුළු සියලුම ජීව අජීව වස්තූන් ප්‍රදානයට යටත් වී තිබේ. මෙකී ගම ප්‍රදානය වන්නේ විහාරයේ නායක හිමියන්ට කැමති අභිප්‍රායක් සිදු කිරීමට හැකි වන ලෙස සියලු බලතල සමඟිනි. ඒ අනුව ගම් ඉඩම සම්පූර්ණ හිමිකම යටතේ ප්‍රදානය වීමක් සිදු වී ඇත. නිරවුල් කරන ලද ගමක් සම්පූර්ණ අයිතියට පවරා දෙන්නේ භික්ෂුවකට ය. සමකාලීන යුගයේ ගම් ඉඩම් අයිතිය හා භුක්තිය හැසිරවීමට භික්ෂුව හමුවේ පැවති හැකියාව ද මේ තුළින් ප්‍රදර්ශනය වේ. ගම් ඉඩම් ප්‍රදානයෙන් ලබන ආදායම කැප ප්‍රත්‍ය වශයෙන් සිවුපසය පරිභෝජනය සඳහා යෙදවිය යුතු බව ද අවධාරණය කොට තිබේ. ඒ අනුව ප්‍රදාන ලාභියා ප්‍රදානයෙන් ලද ආදායම නිශ්චිත කාර්යයක් වෙනුවෙන් යෙදවිය යුතු බව අවධාරණය වී තිබේ. එය ද සමකාලීන යුගයේ ඉඩම් භුක්තිය විෂයෙහි කැපී පෙනෙන ලක්ෂණයකි.

මුලින් ප්‍රදානය කරන ලද ගම් ඉඩම් පසුකාලීන පාලකයා විසින් නැවත විහාර අයිතියෙහි ලබා දීමක් පිළිබඳ ව ලංකාතිලක තඹ සන්නසෙහි4 (ලංකාතිලක තඹ සන්නසෙහි පිටපත, මුදියන්සේ 1971: 77-78) දක්වා තිබේ. මෙහි සඳහන් ආකාරයට ගොඩවෙල යන ගම පෙර රජදවස ලංකාතිලක මහා විහාරයට පිදූ ගමකි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු නැවත වරක් එම ගම එකී විහාරයටම පුදකොට තිබේ. ශ්‍රී රාජාධිරාජසිංහ රජු විසින් ද පෙර රජ දවස ලංකාතිලක මහාවිහාරයට පුදකොට තිබූ 'රබ්බෙගමුව' යන ගම ගොඩමඩ ගෙවතු ගහකොළ

3 පල්ලෙබැද්ද සංඛපාල විහාර තුඩපතෙහි පිටපත, 'පල්ලෙබැද්ද යන ගම ලැබෙඩ කරුණාවට ඒත්තු වී සෙසු ලැබුම් සේ නොව මෙම ගම සතර මා ඉමට ඇතුළත් වූ උඩ වැල්ලාවේ අස්වැද්දුම පටන් ගොඩමඩ සියළුම බිම සහ එහි මිනිසුන් හරකුන් ආදී සියළුම සජීව අජීව වස්තූන් ..... මෙම නායක උන්නාන්සේට මනාප අභිප්‍රායක් කිරීමට පුළුවන් ලෙසට ද බලෙත් සමඟ සියලුම ගම නිරවුල් කොට කැපසරුප් වශයෙන් සිවු පසය පිණිස නින්ද බත්ගම් කොට....'

4 ලංකාතිලක තඹ සන්නසෙහි පිටපත,'ත්‍රිසිංහලාධීශ්වර කීර්ති ශ්‍රී රාජසිංහ නම් වූ මට එක්විසිවන පොසොන් මස පුර ශටවක ලත් අඟහරුවාදා පළමු ලංකාතිලක මහාවිහාරයට පුදවා තිබුණ ගොඩවෙල යන ගම මා විසින් මෙම විහාරයට පිදූ බවත් ශ්‍රී රාජාධිරාජසිංහ නම් වූ මට සත්වන ඉල් මස පුර තිසවක් නම් තිථිය ලත් සඳුදා පළමු ලංකාතිලක මහාවිහාරයට පුදවා තිබුණු රබ්බෙගමුව යන ගම ගොඩමඩ ගෙවතු ගහකොළ පරිවාර ජනයත් ඇතුළු වූ සියල්ල මෙම විහාරයට මා විසින් පිදූ බවටත් ...'

පරිවාර ජනයාත් සමඟ නැවත එම විහාරයටම පුදවා තිබේ. පෙර කාලය තුළ විහාරය සන්තකව පැවති ඉඩම් පසුකාලීන පාලකයන් විසින් නැවත එම විහාරයටම අයත්කොට දුන්නේ ඇයි ද යන්න මෙහිලා නැඟෙන ප්‍රශ්නයයි. මුලින් ප්‍රදානය වූ ගම් ඉඩම සම්බන්ධ නෛතික රාමුවෙහි කිසියම් ගැටලුවක් පසුකාලීන පාලකයාගේ සමයේ දී උද්ගත වූයේ ද යන්න වරෙක කල්පනා කළ හැකි ය. එසේත් නැතිනම් සෑම රජෙකු විසින් ම බෞද්ධාගම කෙරෙහි පැවති නම්‍යශීලීත්වය ප්‍රදර්ශනය කරනු වස් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගත්තේ ද යන්න කල්පනා කළ හැකි ය. කෙසේ වෙතත් මෙම මූලාශ්‍රයාගත තොරතුරුට අනුව පෙර පරිත්‍යාග කරන ලද ගම් ඉඩමක් පසුකාලීන පාලකයාට නැවත ප්‍රදානය කිරීමට කිසියම් බලතලයක් හිමිව පැවති බව අවබෝධ කරගත හැකි ය. එය අයිතිකාරත්වයට පැවරීමක් ද, භුක්තියට පැවරීමක් ද යන්න නිශ්චිත හඳුනා ගැනීමක් මූලාශ්‍රය තුළින් පැන නැඟෙන්නේ නැත.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් බණ පොතක් ලියවා දීම වෙනුවෙන් කරඳන දේවරක්ඛිත භික්ෂුවට සිදු කරන ගම් ඉඩම් ප්‍රදානයක් පිළිබඳ ව මහනුවර යුගයේ දී තොරතුරු ලැබේ (ඤාණවිමල 1942ඃ 51).5 මෙහි සඳහන් ආකාරයට ගම් ඉඩම ඉල්ලා සිටින්නේ භික්ෂුවක් විසිනි. ඒ මියන කොළ කඩා ගැනීම සඳහා ය. භික්ෂුවගේ ඉල්ලීම පිට රජු විසින් දුම්බර කීර ගම පරිත්‍යාග කර තිබේ. සන්නසේ දක්වන ආකාරයට එකී ගම් ඉඩමේ සතර මායිම් කල්ප විනාශය දක්වා නොමැකෙන ඒවා ය. ඒ අනුව ඉඩමේ සීමා දැක්වීමේ දී එහි කල්පැවැත්ම ප්‍රධාන සාධකය බවට පත්කර ගත් බවක් පැහැදිලි වේ. මේ සියල්ලෙන් බලාපොරොත්තු වූයේ භික්ෂුව වෙනුවෙන් ප්‍රදානය වූ ගම් ඉඩමේ අනාගත ආරක්ෂාවයි. මෙම ගම් ඉඩමේ ප්‍රමාණය අක්කර 8305කි. ඒ අනුව මෙම ගම් ඉඩම සැළකිය යුතු තරමේ විශාලත්වයකින් යුතු වූ බව ද පැහැදිලි ය. විජයරාජසිංහ රජු විසින් විජය සුන්දර බණ්ඩාරනායක මුදියන්සේට මැද්දේගම පරිත්‍යාග කිරීම පිළිබඳව මැද්දේගම සන්නසෙහි (මැද්දේගම සන්නසෙහි පිටපත, ඤාණවිමල 1942ඃ 184)6 දක්වා තිබේ. මෙහි සඳහන් කරන ආකාරයට මැද්දේගම ප්‍රදානය වන්නේ සාරමාරු නැතිව ප්‍රවේනි සැලැස්මට ය. බඩවැඩිලිගම් දෙයාකාරයකට ප්‍රදානය කරන අතර සාරමාරු ගම්බිම් වූ කලී එක් ක්‍රමයකට පැවරුණු වර්ගයකි. ඒ වර්ගයේ ඉඩකඩම් දරුමුනුබුරනට පැවරිය නොහැකි ය. ප්‍රවේනි ගම් තමා රිසි කෙනෙකුට පැවරීමට ප්‍රතිග්‍රාහකයාට අයිතිය තිබේ. එවැනි ඉඩම් විකිණීමේ දී 'ප්‍රවේනි ශලැස්මට' යැයි ඇතුළත් කරනු ලැබේ. ඒ අනුව මැද්දේගම සාරමාරු නැතිව ප්‍රවේනි සැලැස්මට දුන්නා යැයි සඳහන් කොට තිබේ.

### ගම් ඉඩම් ආරවුල් හා නඩු ක්‍රියාමාර්ග

කන්ද උඩරට රාජධානි සමයේ ගම් ඉඩම් භුක්ති විඳීමේ දී ඉඩම් ආරවුල් හා නඩුවක් දක්වා ඒවා දීර්ඝ වූ අවස්ථා පිළිබඳ ඓතිහාසික සාධක සන්නස් හා තුඩපත් තුළින් ඉදිරිපත් වේ. නුවර වැවේ සූරිය කුමාර වන්නිසිංහ මුදලියා විසින් නුවරගමරට

5 '... මැඳුම් සඟිය ලියා මහවාසලට ඔප්පු කළ තැනේදී, උවමනා රාජසම්මාන විමසූ රජතුමාට 'මියන කොළ ටිකක් කඩාගන්ට අසල තිබෙන දුම්බර (කීර) ගම ලැබුනොත් මැනැවැ'යි ඒ තෙරණුවන් දන්වා සිටි කල්හි, කල්ප විනාශය දක්වා නොමැකෙන සතර මා ඉම් දමා අක්කර 8305 ක් ඇති නින්දගම පරිත්‍යාග කළේය'

6 මැද්දේගම සන්නසෙහි පිටපත, 'මෙම අටකලං කෝරලේ මැද්දේගම කියන ගම මුල් බිජු දහතුන මුනේ වපසරිය ද එහි බඳ ගෙවතු ගහකොළ ගොඩමඩ ඇතුළුව සාරමාරු නැතුව ප්‍රවේනි සැලැස්මට'

ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706

හුරුළුපත්තුවේ ගම් කීපයක් මායිම් වෙනස්කොට අල්ලා ගන්නා ලදැයි හුරුල්ලෙ පත්තුවෙ ඉලංගසිංහ කළුකුමාර වන්නියා කළ පැමිණිල්ලකට විසඳුම් ලබා දීමක් පිළිබඳ ව ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ තඹ සන්නසක දක්වා තිබේ ( ශිලා ලිපි සංග්‍රහය, දෙවන කලාපය වර්ෂය සඳහන් නැතඃ 4-5).7 මෙම තාම්‍ර පත්‍රයෙන් ඉඩම් භුක්තිය විෂයෙහි පැන නැඟෙන ප්‍රධාන කාරණා දෙකක් හඳුනාගත හැකි ය. ඉන් පළමු වැදගත්ම කාරණය නම් ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් සමකාලීන රාජ්‍ය මැදහත්වීමයි. සූරියකුමාර වන්නිසිංහ මුදලියා නුවරගමරට අයත් හුරුළුපත්තුවේ ගම් කීපයක් මායිම් වෙනස්කොට අල්ලාගෙන තිබේ. මුදලියා යනු මුහන්දිරම්වරුන්ගේ ප්‍රධානියා ය. ගම් ඉඩම් කීපයකම අයිතිය ඔහු යටතේ පවතින්නට ඇත. මෙසේ මායිම් වෙනස් කිරීම සම්බන්ධව හුරුල්ලෙ පත්තුවෙ ඉලංගසිංහ කළුකුමාර වන්නියා පැමිණිල කරන විට ඊට සම්බන්ධ නෛතික කාරණා පරීක්ෂා කිරීම සඳහා මහාවාසල මගින් මහලේකම් අංශයෙන් ද අතපත්තුවේ ලේකමෙන් ද, කටුබුරුලෙ දෙ පත්තුවෙන් ද පණිවිඩකාරයන් යවා තිබේ. මේ අනුව සමකාලීන සමයේ ඉඩම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාවලිය ආයතනික මට්ටමින් සක්‍රීයව ක්‍රියාත්මකව පැවති ආකාරය හඳුනාගත හැකි වේ. ඉඩම් සම්බන්ධ කිසියම් ආරවුලක් පැන නැඟෙන විට ඒ සියල්ල හොඳින් පරීක්ෂා කර බලා සමතයකට පත් කරවීම හා නිවැරදි කිරීමේ නෛතික පද්ධතියක් මහාවාසල කේන්ද්‍රගත කර ගනිමින් ක්‍රියාත්මක වී තිබේ. මෙම මූලාශ්‍රය මගින් දෙවනුව පැනනැඟෙන කාරණය නම් මහනුවර මහ රජුගේ නියෝගයක් මත වුව හුරුලුපලාතේ කඩඉම් ලේඛනගත වී තිබීමයි. රජරටට අයත් ගම්බිම්වල පාලනය තුලාන, කෝරලේ, පලාත, දිසාවනිය යනාදී බෙදුම් පදනම් කොට සැකසී ඇත. එහෙයින් ගම්, පළාත් ආදියේ මායිම්වල ව්‍යතික්‍රමයන් වුවහොත් එයින් පාලන තන්ත්‍රයෙහි ගැටලුවක් පැන නැංවෙන්නේ ය. විශේෂයෙන් මෙහිලා සැළකිය යුතු තත්ත්වය නම් මෙහි මායිම් බිඳී ඇත්තේ මුදලියකු අතින් වීමයි. පැමිණිලි කර ඇත්තේ ද මුදලියකු විසිනි. ලේකම්මිටි ආදිය අයත් අංශය ඇතුළු අංශ දෙකක නිලධරයන් යොදා මේ උල්ලංඝනය සමථයකට පත් කිරීමට නොපමාව මහාවාසල උත්සාහ දරා ඇත්තේ ඒ නිසා ය. මෙම සන්නස නිකුත් කොට ඇත්තේ මහනුවර රාජධානි සමයෙහි අවුල් වියවුල් සහගත සමයක වුව ද රජරට හුරුලු පළාත පාලනය වූයේ මහනුවර රජවාසලින් බව නිසැකව ම ඔප්පු වේ. 'මහ ලේකමෙන් අතපත්තුවේ ලේකමෙන් කටුබුරුලෙ දෙපත්තුවෙන් පනි උඩකාරයින් අරිමින්' යනුවෙන් හෙළිවනුයේ මේ පළාත මහනුවර සිට කිලෝමීටර එකසිය හැටක් පමණ ඈතින් පිහිටා තිබුණත් එහි අණසක නොඅවුල්ව නොබිඳී පැවති බවයි. වර්තමානයේ 'හුරුලු පළාත' යනුවෙන් හැඳින් වූ ප්‍රදේශය එකල 'හුරුලු පත්තුව' යනුවෙන් දක්වා ඇති අතර එහි සතරසීමා මෙම ලේඛනයේ නිවැරදිව දක්වා තිබේ. නැඟෙනහිර මායිම තිරවනා හින්නත්, කෝදුරුව හින්නත් වනවිට කඩියන්හින්න හා රිටිගල දකුණු මායිම වී තිබේ. උතුරු මායිම වූයේ නයිනංගලයි. ඉච්චන්කුලමෙ වටාපොත ගලත්, වටරක්වැවේ කුළුමීවුඩා කඩන් කුඹුක්ගොල්ලෑවෙ වැද්දාකන්දේ ඉරසඳ කොටාපු පළුවගාව ගල් ටැඹක් ආදිය බස්නාහිරින් සීමා වී තිබේ.

7 ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ තඹ සන්නසෙහි පිටපත, '... නුවර කලාවියේ දිසාව බඳ නුවරවැවේ සූරියකුමාර වන්නිසිංහ මුදලියා විසින් නුවරගම රටට හුරුළු පත්තුවෙන් ගත් කීපයක් පසු පලමු කඩඉන්වලින් මෙපිට ඇවිත් අල්ලාගත්තාය කියා හුරුල්ලෙ පත්තුවේ ඉලඟසිංහ කළුකුමාර රාජකරුණා මුදලියා පැමිණ සිටිනා නිසා මහලේකමෙන් අතපත්තුවෙ ලේකමෙන් කටු බුරුලෙ දෙපත්තුවෙන් පනිඋඩකාරයින් අරිමින් මෙම රටට පසු පළමු තිබුණු කඩයින් ඇද ඇර දෙමින් .... මෙම මුදලියාගේ වර්ග පරම්පරාව දක්වා නිරවුල්ව භුක්ති විඳිනා රඟට....'

රාජ අපරාධයක් නිසා දේපොළ රාජසන්තක කර අන්සතු කිරීමේ විනිශ්චයක් පිළිබඳව කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයට අයත් සීට්ටුවක සඳහන් වී තිබේ. උඩගම අතපත්තු මොහොට්ටාලගේ හස්තසාර ධනය අමුණේ තැන්නේ මද්දුමා අප්පු ගත් නිසා ඒ වැරැද්දට ඔහු සතු ගම්පඟුව නැසීගිය අයගේ මාමා වන උඩගම බත්තනරාළට පැවරීම පිළිබඳ ව එහි සඳහන් කර ඇත (ඤාණවිමල 1942: 239). අන්සතු දේපොළ අල්ලා ගැනීම රාජ අපරාධයක් ලෙස සළකා එකී දේපොළ රාජ සන්තක කිරීමට පියවර ගැනීම සමකාලීන යුගයේ ඉඩම් භුක්තිය හා බැඳි නෛතික ව්‍යූහය හඳුනා ගැනීමට උපකාරී වේ. එකී ගම් පඟු රාජසන්තක කොට අයිතිකාර පාර්ශවයට යළිත් පවරා දීමට සමකාලීන රජය පියවර ගෙන තිබේ. මෙවැනිම ස්වරූපයේ ගම් ඉඩම් ආරවුලක් පිළිබඳ ව පිළිමතලව්වේ මහ අධිකාරම්තුමාගේ විනිශ්චයක තොරතුරු සඳහන් වී තිබේ (පිළිමතලව්වේ මහ අදිකාරම්තුමාගේ විනිශ්චයක්ම අදාළ තුඩපත ඤාණවිමල 1942: 307). පිළිමතලව්වේ මහ අදිකාරම්තුමාගේ විනිශ්චයක්ම අදාළ තුඩපත, 'සබරගමු දිසාවෙන් කොලොන්න කෝරලේ බද දළඳා මාලිගාවට පිද වී තිබෙන කැල්ල කියන ගමින් කොනේරිකොන් ද බිත්තර අමුනේ වපසරියක් අරාවේ බිත්තර පැලක් මැද ඉරිකොන්දෙ අරාව හත්ලාහක් හිටිහාමි මොහොට්ටාලගේ වත්තත් රැක්කපාපු හේන් කොරටු හයත් ඇතුළුව මේ කියාපු ගම් පඟු ගම්මාසමට අයිති කරගෙන හිටිනවාය කියා කොලොන්නේ රත්නැක කෝරාල විහින් මෙතැන පැමිණ සිටිය නිශා මෙකියාපු පඟුවලට මින් ඉදිරි ගම්මාසන්කරණ අය විහින් අවුල් වියවුල් නොකෙරණ ශටියට....' මහ සමන් දේවාලයේ රාජකාරියට යටත් කැල්ල ගමේ පිහිටි ගම් පන්ගු පහක් එහි භාරකාර වූ රත්නායක කෝරාළගෙන් කොල්ල කාගෙන ගම්මාසම්කාරයන් භුක්ති විඳිම නිසා ඇති වූ හබයක් පිළිමතලව්වේ අධිකාරම්තුමා විසින් විසඳා රත්නායක කෝරාළටම පවරා දීමක් පිළිබඳ ව එහි තොරතුරු අන්තර්ගත වේ. මෙහි සඳහන් ආකාරයට දළඳා මාලිගාවට පුදා තිබෙන ගම් ඉඩම් පඟු කිහිපයක් ම ගම්මාසන් කාරයන් විසින් කොල්ලකෑමට පටන්ගෙන ඇත. කලින්කල අඩුවැඩිවැ පවත්නා රාජ්‍යයෙහි ආරක්ෂාව පිළිබඳ කටයුතුවල යෙදුණු සේවකයන්ට වේතනය දෙපරිද්දකින් ලැබුනු අතර සිය සේවය සඳහා ඉඩම් ලැබුවෝ ගම්මාසම්කාරයන් ලෙස ප්‍රසිද්ධ වී තිබේ. මෙකී ගම්මාසම් කාරයන් විසින් දළඳා මාළිග ාවට අයත් ඉඩම් කොල්ල කෑම නිසා ඇති වූ හබය නිරාකරණය කරන්නේ පිළිමතලව්වේ අධිකාරම් විසිනි. මේ අනුව සමකාලීන යුගයේ ඉඩම් හා සම්බන්ධ නඩු හබ හා ඒවායේ විනිශ්චයන් පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි වේ.

### කුඹුරු ඉඩම් භුක්තිය හා බැඳි නෛතික විධිවිධාන

උඩරට රාජධානි සමයේ ඉඩම් භුක්තිය පිළිබඳ සිදු කෙරෙන මෙම සාකච්ඡාවේ දී කුඹුරු ඉඩම් භුක්තිය ද සුවිශේෂී වේ. සමකාලීන යුගයේ දක්නට ලැබෙන සුවිශේෂම තත්ත්වය නම් වත්තක් හෝ කුඹුරක් වුව ද හැඳින්වීම සඳහා 'ගම' යන පදය යොදාගෙන තිබීම ය. ගමක ප්‍රධාන කේන්ද්‍රස්ථානය වූයේ වෙල්යායයි. අධ්‍යයනයට භාජනය වන කාල අවකාශ සන්දර්භය තුළ ජීවත් වූ ගැමි ගොවියාගේ නිශ්පාදන ජීවිතයේ ප්‍රධාන අංගය වූයේ ද මඩ කුඹුරුවල කෙරුණු වී වගාවයි. පළමුවෙන් ම මෙම නිෂ්පාදන ක්‍රියාව මඟින් අදාළ ගැමි ගොවි ප්‍රජාවගේ ප්‍රධාන ආහාරය වූ බත් සැපයුණු අතර දෙවනුව අදාළ ගැමි ගොවි ප්‍රජාවේ ඵලදායී ලෙස යොදා ගැනුණු සමස්ත ශ්‍රම ප්‍රමාණයෙන් මූලිකම හා වැඩිම

කොටස මෙම නිෂ්පාදන කාර්යය සඳහා යෙදවුණු බව පෙනේ. විශේෂයෙන් මෙම ගැමි ගොවි ජනයාගේ ශ්‍රම සංවිධානය සමස්තයක් ලෙස සකස්ව තිබුණේ ද මඩ කුඹුරු වී වගාව කේන්ද්‍ර කරගෙන වීම වැදගත් ය. එනිසා කුඹුරු වගාවට හිමි වූ මෙම සුවිශේෂී තත්ත්වය නිසා පුද්ගල විෂයෙහිත්, ආරාම සඳහාත් කුඹුරු ඉඩම් ප්‍රදානය කිරීමේ ප්‍රවනතාව මහනුවර යුගයේදී ද දක්නට ලැබේ. කන්ද උඩරට රාජධානි සමයේ දී සෑම ගමකටම එහි වටිනාකම කොටස ලෙස සැළකුණු 'මඩ බිම්' පිහිටා තිබිණි. වැසියාගේ දෛනික ජීවිතය ගොවිතැන් කිරීම මත සංවිධිත වූ බව පෙනේ. උඩරට දක්නට ලැබුණු විශේෂම තත්ත්වය නම් බෑවුම්වල ආලින්දාකාර කුඹුරු තැනීමයි. මෙහි කුඹුරු වගා ක්‍රමය හා එහි ස්වභාවය පිළිබඳව රොබට් නොක්ස් සිය වාර්තාවේ ( පීරිස් 2001: 42) දක්වා ඇත්තේ මෙවන් අදහසකි.

'මේ සියලුම වී වර්ගවල වැඩීමට පැළ වී තිබෙන මුළු කාලය තුළම ජලය අත්‍යවශ්‍ය ය. මේ නිසාම එහි වැසියෝ ඔවුන්ගේ කුඹුරුවලට වතුර ලබා ගැනීම පිණිසත් ජලය පරෙස්සම් කර ගැනීම පිණිසත් ගං හෝ වැව් ආදියෙන් තම කුඹුරුවලට ජලය ලබා ගැනීම සඳහා වාරිමාර්ග තැනීමටත් බොහෝ වෙහෙසෙති. ජලවහන මාර්ග තැනීමට හා බිම් සමතලා කර සකස් කිරීමට ඔවුහු ඉතා දක්ෂවෙත්. නිවාස භූමි පන්දු කෙළි මඩුලු මෙන් සමතලා කරති. එකල මුළු බිම නිසියාකාරව ජලයෙන් වැසී යයි. බෑවුම් හා කඳු සහිත බිම් පවා නිසි ලෙස දියෙන් වැසී යන පරිදි සකස් කිරීමට, ඔවුහු අදක්ෂයෝ නොවෙති. එවැනි බිම් සකසා ගැනීම සඳහා මෙවැනි ක්‍රමයක් ඔවුහු අනුගමනය කරති. කඳු බෑවුමට සරිලන අයුරු අඩි තුනේ පටන් අට දක්වා පළලට උඩු යටි වශයෙන් පිළියෙල වෙන සේ ලියදි බෙදා පස් කොටා සමතලා කෙරේ. එවිට කඳු බෙයදේ සිට මුදුන තෙක් හිණි පෙළක් මෙන් ලියැදි සෑදෙයි. ඉක්බිති කඳු මුදුනේ තිබෙන දිය දහර ක්‍රමයෙන් පහතට ගලා ඒමට සලස්වා ක්‍රමයෙන් සියලුම ලියැදිවලට ජලය ලැබීමට සලස්වනු ලැබේ. උඩ ලියද්දට වුවමනා පමණ ජලය ලැබුණු පසු අතිරික්ත ජලය ඊළඟ ලියද්දට වැටේ. මේ අයුරින් අහස ඇමිණී තිබෙන්නාක් මෙන් පිහිටි බිම් කැබෙලිවලට අනුක්‍රමයෙන් ජලය ලැබේ.'

කුඹුරු ඉඩම් ප්‍රදානය කිරීමේ දී එකී කුඹුරු ඉඩම හා සම්බන්ධ වන අඩත්තු දේවල් ප්‍රදානය කිරීම ද සාමාන්‍ය සම්ප්‍රදාය විය. වතු හා හේනේ ඇතුළත ගොඩබිමකින් සෑදුණ අඩත්තු දේවල් සෑම ගම් වසමකම පිහිටි කුඹුරුවලට සම්බන්ධ වී තිබිණි. පවුලක මූලික අවශ්‍යතා අතර වන වී, පොල්, එළවළු, බුලත්, පුවක්, දර, තණබිම් පැණි හා දඩමස් සැපයීම කුඹුර හා අඩත්තු දේවලින් සම්පූර්ණ විය. කොට කුඹුර නම් වූ පස්පැළක් වැපිරෙන මුල් පංගුව හෙවත් මුල් කුඹුර හාලියද්දේ ලොකු මුදියන්සේ තම පුතුන් දෙදෙනා අතර බෙදා දෙන විට ඒ හා සම්බන්ධව පවතින අඩත්තු දේවල් බෙදා දීමට වගබලා ගත්තේ එහි වටිනාකම් නිසා ය ( හාලියද්ද තලුපොටවඩන මුදියන්සේට එදිරි ව සිරාලේ පැවරූ නඩුව, උඩරට පළාත් පිළිබඳ කොමසාරිස් මණ්ඩලය, 1817.07.17, ලංකා රාජ්‍ය ලේඛනාගාරය, 23/3). එම බෙදා දීමට අනුව මුල් කුඹුරෙන් භාගයක් හා එයට සම්බන්ධ ගොඩබිම් ද අප්පුරාළට ලැබිණි. අනෙක් කොටස වන කුඹුරෙන් දෙපැල පස් ලාහක් හා එයට සම්බන්ධ ගොඩබිම් ද ටිකිරිරාලට ලබා දී තිබේ. අඩුත්තු දේවලට අයත්ව පිහිටි 'වත්ත' නමින් හැඳින්වූ කොටසේ තිබූ මුල් ගෙදර පිහිටි කොටස දෙදෙනාගේම භුක්තියට පවරා ඇත.

කොබ්බෑකඩුව සන්නසෙහි සේනාසම්මත වික්‍රමබාහු රජු විසින් මෙනවරමාවෙල රත්නවල්ලි තෙර සාමින්ට වටනාපස දානක්ෂේත්‍ර කොට ප්‍රදානය කරන ලද කුඹුරු ඉඩමක් සම්බන්ධ තොරතුරු අනාවරණය වේ (කොබ්බෑකඩුව සන්නසෙහි පිටපත තිස්සකුමාර 1992ඃ 130).8මහනුවර යුගයේ දී රජු විසින් වාසනාහාමි එතනාට ප්‍රදානය කරන කුඹුරු ඉඩම් රැසක් පිළිබඳව තොරතුරු ඉදිරිපත් වේ. ගන්නිලේ වක්කුඹුර හයමුන, පෙරමස් කුඹුර හයමුන, ගෙදර කුඹුර හයමුන, උඩවෙල පහමුන, අඹගහකුඹුර තුනමුන, කහටදන්ඩ දහමුන, නිලදෙක අටමුන, ඉළුක්කුඹුර හාමුන, කන්දෙකුඹුර පහමුන, බිත්තර අමුන තුනමුන, පිංකුඹුර දෑමුන, බදුල්ලේ කැලිදල්ලාවන පහමුන, කුරවතුරේ කුඹුර අටමුන, බෝගොඩ ජම්බුගහඅරාව තුනමුන, බැද්දේගම අස්වැද්දුම පහමුන, ඌරුමීතැන්න හතමුන, අස්වැද්දුම පහමුන, කඩපයිය තුනමුන, මඩුගස්තලාවේ ඇටකුළුගොල්ල, මහකුඹුර තුනමුන, මොරහෙල අස්වැද්දුම තුනමුන, ආරේ වෙල දෑමුන, මුලතකුඹුර දෑමුන, බෝලියද්දේ මුත්තෙට්ටු කුඹුර තුනමුන, මැටිගහතැන්නේ කමත්ගොඩ කුඹුර සතරමුන, පරතැන්න පහමුන, කඳුකර බට ගම්මන ගම තිස් අමුන, දෙහිකඳ දොළොහොමුන, වැල්ලවාවෙන් සියඹලාගුනේ ගම දහමුන ආදී කුඹුරු ඉඩම් රැසක් එකී කාන්තාව විෂයෙහි ප්‍රදානිත ය. ඇල්දෙණිය සන්නසෙහි ද රජු විසින් සිල්පතිලක නවරත්න දවුන්ඩ සිප්පාචාරියාට සිදු කරන කුඹුරු ඉඩම් ප්‍රදානයක් පිළිබඳ ව සඳහන් වේ (ඇල්දෙණිය සන්නස තිස්සකුමාර 1992ඃ 132). දෙහි අත්ත කුඹුර බිජු යේලමුන, රදාවෙල බිජු අමුන, මුගලම බිජු තුම්පැල, පළෙල දෙනිය බිජු දෙපැල, ගොඩහුං දෙනිය බිජු තුම්පැල, තැඹිලිගල කුඹුරු බිජු දෙපැල, හපුගස් කුඹුර බිජු පස්පැල,කොහොලණ බිජු දෙපැල, පල්ලෙබො කුඹුර බිජු අමුන, නාරං කුඹුර බිජු පස්පැල, අඹඅඟ බිජු තුම්පැල, නාරං කුඹුර බිජු තුන්පැල, ඇල්ලෙදෙනිය බිජු අමුන, අමුනුගමින් අස්වැද්දුම බිජු පස්පැල, සත දුඹර බද අමුනු ගමින් අස්වැද්දුම බිජු ,මන්දන්ඩෙ කුඹුර බිජු අමුණ, වැටකෙඋල්ල බිජු දෙපැල, ඌරාතොට කුඹුර තුම්පැල, අස්වැද්දුම බිජු දෙපැල, සිටිකලාල කුඹුර තුම්පැල, දුල්මුරේ බිජු පැල එසේ ප්‍රදානිත කුඹුරු ඉඩම් අතර වේ. මෙම කුඹුරු ඉඩම් ආචාරියාගේ මුතුං මිත්තන් අවධියේ සිටම ප්‍රදානිත වූ ඒවා වුවත් එසේ ලබාපු සන්නස් තල්පත් ජීර්ණය එනම් විනාශයට පත්වී තිබීම නිසා නැවත ප්‍රදානය කිරීමක් සිදුකර ඇති බව පැහැදිලි ය.

මහනුවර ලේවැල්ලේ ගංගාරාම ගිරි ලිපියෙහි (මහනුවර ලේවැල්ලේ ගංගාරාම ගිරි ලිපිය, ශිලා ලිපි සංග්‍රහය, දෙවන කලාපය , 9-10) කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ගංගාරාම විහාරයට ප්‍රදානය කරන කුඹුරු ඉඩම් පිළිබඳ ව සඳහන් කර තිබේ. බිබිලෙවැව කුඹුර, මගන කුඹුර, ගල්පොත්තේ කුඹුර, වත්තේ ආරච්චිලාගේ කුඹුර, අරුප්පලින් මීගස්කුඹුර මුත්තෙට්ටුව, ගැටදෙණිය අසවැද්දුම ,තලවියා කුඹුර පින්දෙනිය ආදී කුඹුරු ඉඩම් රැසක් විහාර භුක්තියට ලබා දීම සම්බන්ධ ව ලිපියේ තොරතුරු අන්තර්ගත වේ. ක්‍රි.ව. 1726 දඹුලු විහාර තුඩපතෙහිත් ( දඹුලු විහාර තුඩපත, මුදියන්සේ 1971ඃ 65-70 ) දඹුලු විහාරයට සිදු කරන කුඹුරු ඉඩම් ප්‍රදානයක් පිළිබඳ ව සඳහන් කර තිබේ. මෙම තුඩපතට අනුව මුල්කාලීන රජවරුන් විසින් දඹුලු විහාරයට ප්‍රදානය කරන ලද ඉඩම් ගැන විස්තර අයත් වුවත් පළමුවන රාජසිංහ රජ දවස එය අස්ථානගත වී තිබේ. මේ හේතුව නිසාම පළමුවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව. 1592-1604) එම ඉඩකඩම් නැවත භික්ෂු නඩත්තුව හා විහාරයේ දෛනික පූජා කර්ම සඳහා

8 කොබ්බෑකඩුව සන්නසෙහි පිටපත, 'කොබ්බ්‍යාකඩුවෙන් ඇඹලොළුවෙ කුඹුරු බිජුවට පසමුනක් හා මෙහි බද සතර මාඉම ... ඇතුළු වූ මෙකී සියල්ලක් ශ්‍රීමත් මෙනවරමාවෙල රත්නවල්ලි තෙර සාමීන්ට වටනාපස දානක්ෂේත්‍ර කොට....'

ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706

කහවන්දල තන්හංකර හිමියන්ට තුඩපතක ලියා ප්‍රදානය කර තිබේ ( සෙනෙවිරත්න 1995ඃ 98-99).9 මෙසේ පුදන ලද කුඹුරු ඉඩම් සිරස්ගොමුව, නලල්කුඹුර, ගිරියක් කුඹුර, වැලමිටියාව, පාදෙණිය යම් ගම්වලට අයත්ව පිහිටා තිබේ. "එසේම ද්විතීයක තන්හන්කර හිමියන් විසින් ද විහාරයෙහි බිත්ති පවුරු පදනම් ආදී නටඹුන්ව තිබුණු දේත් දියුණු කරවා පළමු ලැබුණු සතර මායිමට ඇතුළත් වූ බිම් මායිමෙහි රුක් බිඳවා රත්මලගහ ඇල, යාපාගම, මොරගොල්ලා වැව, බිම් තඹුර, පිලගම්මන, මැද මුල්ල, රත්මලගොල්ල යන වැව් හතක් බඳවා බිජු විසි අමුණක කුඹුරු කරවා"යනුවෙන් එහි වැඩිදුරටත් සඳහන් කර තිබේ. මෙහි සඳහන් කරන ආකාරයට වැව් නිර්මාණයත්, කුඹුරු ඉඩම් අස්වැද්දීමත් සිදුකරන්නේ භික්ෂුවක විසිනි. විහාර සන්තක ගම් ඉඩම් ගම්වැසියාට ලබා දී මෙකී අස්වැද්දීම සිදුකරන්නට ඇත. ඉඩම් හා සම්බන්ධ භික්ෂුව සතු යාන්ත්‍රණය පිළිබඳ අවබෝධයක් මින් ලබාගත හැකි වේ. මෙම ඉඩම් සමහර අවස්ථාවල දී සුවිශේෂී සේවාවන් සඳහා සෙනරත් රජුගේ නියෝගය මත දඹුලු විහාරයේ අලුත්වැඩියා කටයුතු කළ වේල්පිටියේ අබේසිංහ මුදියන්සේට ප්‍රදානය කළ බවක් හඳුනාගන්නට ලැබේ ( සෙනෙවිරත්න 1995ඃ 99).10 ඇතැම් අවස්ථාවල දී විහාරය සන්තක ඉඩකඩම් විෂයෙහි වගකිවයුත්තා ලෙස විහාරාධිපති විසින් විවිධ අංශවලට අදාළ රාජකාරි කරන්නන් පත් කරන ලද අවස්ථා ද දක්නට ලැබේ. දෙවැනි විමලධර්මසූරිය රජ දවස (ක්‍රි.ව. 1687-1707) ද්විතීය තන්හන්කර ස්ථවිර විසින් විහාරයේ විවිධ අංශවලට අදාළ රාජකාරි කරන්නන් පත් කර තිබේ. මාහේනේ ගල්ලද්දා ලවා රජමහාවිහාරේ ගල් වාහල්කඩ ඉදිරිපිට ගලට සණ්ඨාරයක් පාස්සවා ගල් සිදුරට ඊයම් වක්කරවා වී අමුණක වපසරිය කුඹුරකුත් පනම් 200 කුත් බරපැන් පිණිස ලබා දුන් බව එහි සඳහන් වේ( සෙනෙවිරත්න 1995ඃ 99-100).

හන්දුකන්දේ කෝණාර රණසිංහ ගම්පත්කඩයෙහි අනියම් බිරිඳකගේ දරුවාට එනම් ඩිංගිරිමැණිකාට සිය බූදලයෙන් කොටසක් වෙන් කිරීම පිළිබඳ ව සඳහන් කර තිබේ ( හන්දුකන්දේ කෝණාර ගම්පත්කඩය, ඥාණවිමල 1942ඃ 82) එකී බූදලය අතරට කුඹුරු ඉඩමක් ද අයත් වී තිබේ. 'මා වෙනුවට උපන් ඩිංගිරි මැණිකාට පෙල වාසියක දුන්නෝතින් මට අයිති රණසින්හ මුදලි ගමෙන් බෝගහ කුඹුරෙන් වී පහලොල්ලහක හරිය දැවැද්ද පිණිස අයිතිකර දුන්නා ඇත.' මෙහි සඳහන් ආකාරයට ඩිංගිරි මැණිකා යනු ඇරැපොල කෝරලේ මහත්මයාගේ අනියම් බිරිඳකගේ දරුවෙකි. ඇයට හිමි දැවැද්ද වශයෙන් කුඹුරක් ප්‍රදානය කිරීම මෙහි සඳහන් කර ඇත. එහෙත් ඇය පෙලවාසියක දෙන්න බැරි වී ගමේම

---

9 'දඹුලු ගලට නැඟෙනහිරින් රත්මල් ගහ ඇලේ කන්දේ ඌරුවිගොල්ලේ උල්පතින් හා මෙම කන්දෙ දිය බස්නාවෙන් බිම් කුඹුරේ කඳු කොනින්.... කබරගල්පොත්තට ද මෙම කන්දේ මහමළුවා ගලෙන් හා බඹරගල ඇලෙන් මෙපිට ද දකුණු දිගින් කැන්ද ලන්දේ ගල් හිරියෙන් හා පුරක්ගැටේ හින්නේ මී දඹා ඔයෙන් දඹුලු ඔයෙන් මෙපිට ද බස්නාහිරෙන් මෙම දඹුලු ඔයෙන් සබරඅත්තා ඇල දෙමෝදරින් මෙපිට ද උතුරු දිගින් මෙම සබරඅත්තා ඇලෙන් හා නාවාගස්හන්නේන් හා කණ්ඩලම් වැවේ ව කොණින් පළමු කී රත්මල්ගහ ඇලේ කඳු කොනින් මෙපිට ද මේ කියාපු සතරමායිමට ඇතුලත් ගොඩමඩ... වැලමිටියාවේ කොහොලාන සතර අමුණෙන් දාරළුව දහඅට අමුණෙන් මෙම මුල් බිජු දැමුණේ වපසරියෙන් ඊට අඩුක්කු ගොඩමඩ ඇතුළුව..... කහවන්දල තන්හන්කර තෙර ස්වාමින්ගේ ශාසන පරම්පරාවට මේ විහාර ලාභයා ස්ථිරව පවත්නා රඟට....'

10 'ඉක්බිතිව අකුරම්බොඩින් බිත්තර වී තිස් අමුණකුත්, පල්ලේපොලින් යකඩ තිහකුත් දුටු කොළගම පට්ටියෙන් මී ගොන් දස දෙනෙකුත්, කණ්ඩලමින් එළහරක් දස දෙනකුත් කදුරුවෙල ගබඩාගමින් වැලිපැන්නෙ මී හරක් 10 දෙනෙකුත් ලැබී ලේනාවල කියන ගමේ ලැඟුම් ගෙවල් සිද්ධකරන හැටියට අබේසිංහ මුදියන්සේට උතුම් වූ අවසර ලැබී ය.'

නැවතී සිටියොත් ඇරැපොල කෝරලේ මහත්මයාට අයිති සෑම ගම්වලින් කොටසක් ඇයට අයිති වේ. ඇගේ අනාගතය දීග, බින්න විවාහ ක්‍රම දෙකටම ඉඩ තබා එය සිදුවන ලෙස ස්වකීය දේපල අඩු වැඩි වශයෙන් අයිති වන්නට ලියා තැබීම නිසා මෙම පැරණි ලියවිල්ල සමකාලීන යුගයේ ඉඩම් භුක්තිය විෂයෙහි සුවිශේෂී ලියවිල්ලකි.

## නිගමනය

උඩරට රාජධානි සමයේ ගම් හා කුඹුරු ඉඩම් භුක්තිය හා බැඳි නෛතික විධිවිධාන පිළිබඳව සිදු කරන ලද මෙම අධ්‍යනයේ දී පැහැදිලිව පෙනී යන කරුණක් වූයේ මෙරට ක්‍රියාත්මක දේශීය ඉඩම් භුක්ති ක්‍රමයෙහි දිගුවක් උඩරට රාජධානි සමයේ දී ද දැකිය හැකි වුවත් එහි අනන්‍යතා ලක්ෂණ දැකිය හැකි වූ බව ය. සමකාලීන අවධිය වන විට රජරට සහත්ව අවධියට සාපේක්ෂව ඉඩම් අඩුවී යාම නිසා ඒවා භුක්ති විඳීම් සම්බන්ධ නෛතික රාමුව වඩාත් ස්ථාවරව පවත්වාගෙන යාමේ ප්‍රතිපත්තියක් පාලකයන් විසින් අනුගමනය කර තිබේ. විශේෂයෙන් මහනුවර රාජධානි සමයෙහි ගම් සහ කුඹුරු ඉඩම් භුක්තියෙහි විශේෂතා පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලිව පෙනී යන තත්වයන් වන්නේ රජරට හා නිරිතදිග රාජධානි සමයට සාපේක්ෂව ඉඩම් නඩු පිළිබඳ වැඩිමනක් තොරතුරු අනාවරණය වීම ය. සූරිය කුමාර වන්නිසිංහ මුදලියා හුරුළුපත්තුවෙ ගම් ඉඩම් කිහිපයක් මායිම් වෙනස්කොට අල්ලා ගැනීමට උත්සාහ ගත් විට මහාවාසල මගින් නිලධාරී මඬුල්ලක් පත් කොට ඉඩම් ගැටළුව නිරාකරණය කොට තිබේ. මහනුවර යුගයේ දී අන්සතු ඉඩම් අල්ලා ගැනීම කොපමණ වර්ධනය වුයේ ද යත් අන්සතු දේපල අල්ලා ගැනීම රාජ අපරාධයක් ලෙස සළකා එම දේපල රාජසන්තක කිරිමේ දඬුවම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට පවා රජවාසලට සිදු වී තිබෙයි. එනිසා මහනුවර යුගය වන විට ඉඩම් නඩු හා සම්බන්ධ කාරණය ඉතා සංකීර්ණ තත්ත්වයක් කරා වර්ධනය වු බවක් ද හඳුනා ගත හැකි ය. උඩරට රාජධානි සමයේ ක්‍රියාත්මක වූ ඉඩම් භුක්ති ක්‍රමය හුදෙක් නෛතික ලක්ෂණවලින් පමණක් සමන්විත නොවු අතර ඒවා, තත් සමාජය, ආර්ථිකය, පරිපාලනය ආදිය සමග බද්ධ වූ සංකීර්ණ ස්වභාවයක් ගන්නා ලද බව අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

## පරිශීලිත ග්‍රන්ථ

අභයවර්ධන, එච්.ඒ.පී., (1978), කඩඉම්පොත් විමර්ශනය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, දයාවංශ මුද්‍රණ ආයතනය, කොළඹ.

කොඩ්රින්ටන්, එච්.ඩබ්., (1980), ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ඥාණවිමල හිමි, කිරිඇල්ලේ, (1967), සපරගමු දර්ශන, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ඥාණවිමල හිමි, කිරිඇල්ලේ, (1942), සපරගමුවේ පැරණි ලියවිලි, මානවහිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.

තිස්ස කුමාර, ආනන්ද, (1992), සිංහල සන්නස් සහ තුඩපත්, සාර ප්‍රකාශන හා මුද්‍රණ, කොට්ටාව.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ, (1966), ඌව ඉතිහාසය, ගුණසේන සහ සමාගම.

පීරිස්, රල්ෆ් (2001), සිංහල සමාජ සංවිධානයː මහනුවර යුගය, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

මුදියන්සේ, නන්දසේන, (1971), ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.

ශිලා ලිපි සංග්‍රහය, දෙවන කලාපය, (වර්ෂය සඳහන් නැත), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

සෙනෙවිරත්න, අනුරාධ, (1995), රන්ගිරි දඹුලු රජමහා විහාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

Codington, H.W., (1938), Ancient Land Tenure and Revenue in Ceylon, Colombo.

**පරිශීලිත අභිලේඛන, සන්නස් සහ තුඩපත්**

ඇල්දෙණිය සන්නස

කොබ්බෑකඩුව සන්නසෙහි පිටපත

දඹුලු විහාර තුඩපත

පල්ලෙබැද්ද සංඛපාල විහාර තුඩපතෙහි පිටපත

මහනුවර ලේවැල්ලේ ගංගාරාම ගිරි ලිපිය

මාරුකොණ සන්නස

රඹුක්පොත සන්නස

ලංකාතිලක තඹ සන්නසෙහි පිටපත

වාරිගම අතපත්තු රාළගේ තුඩපතෙහි පිටපත

හාලියද්ද තලුපොටවඩන මුදියන්සේට එදිරි ව සිරාලේ පැවරූ නඩුව

හන්දුකන්දේ කෝණාර ගම්පත්කඩය

හාලියද්ද තලුපොටවඩන මුදියන්සේට එදිරි ව සිරාලේ පැවරූ නඩුව, උඩරට පළාත් පිළිබඳ කොමසාරිස් මණ්ඩලය, 1817.07.17, ලංකා රාජ්‍ය ලේඛනාගාරය, 23/3